සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය - I

නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 03 යි.

සැලකිය යුතුයි:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටස අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඔබට දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ කවය තුළ ලකුණු කරන්න.

1. අභියෝග වලට සාර්ථකව මුහුණ දුන් පරමාදර්ශී චරිතය වන්නේ,
   1. මහා බ්‍රහ්මයාය
   2. බුදුරජාණන් වහන්සේය
   3. අනේපිඬු සිටුතුමාය
   4. සුද්ධෝදන රජතුමාය

2. බුදුරජාණන් වහන්සේගේ මුවින් පිටවූ පළමු උදාන වාක්‍යයේ මුල් පද පේළිය වන්නේ,
   1. අග්ගෝ හමස්මි ලෝකස්ස
   2. අනේක ජාති සංසාරං
   3. චරථ භික්ඛවේ චාරිකං
   4. යෝ ගිලානං උපට්ඨහෙය්‍යා

3. තන්හා, රතී, රගා යනු,
   1. සුකුමාල දූවරුන් තිදෙනෙකි
   2. මාර දූවරුන් තිදෙනෙකි
   3. සිදුහත් කුමරාට පියරජතුමා හැදූ මාළිගා 3 කි
   4. ධර්ම කරුණු 3 කි

4. සිත් පිත් නොමැති වෘක්ෂයක් දෙස සතියක් ඇසිපිය නොහෙළා බලා සිටීමෙන් බුදු රදුන් ලෝකයාට පෙන්නුම් කළේ,
   1. ගසක ඇති මුදල්මය වටිනාකම ය
   2. කළගුණ සැළකීමේ මහහැඟි ආදර්ශය යි
   3. ඇස් දෙකේ ඇති ශක්ති සම්පන්න බවයි
   4. ගස හා පොත්ත අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධයයි

5. බෝධි සත්ත්වවරයෙකුගේ පළමු අභිලාශය වන්නේ,
   1. තමා ධර්මය අවබෝධකර ගැනීමය
   2. අන් අයට ධර්මය අවබෝධ කරවීමය
   3. පවුලේ අයට පළමුව ධර්මය අවබෝධ කරවීමය
   4. තමා සසර දුකින් මිදීමය

6. බුදු රදුන් තනතුරු පිරිනැමීමේ දී සලකා බැලුවේ තනතුරු ලාභියා සතුව පැවැති,
   1. ගෝත්‍රය, කුලය හා ජාතියයි
   2. බලය, ධනය හා පරිවාරයයි
   3. තනතුරු ලාභියාගේ කුසලතා හා නිපුණතාවයයි
   4. පාට, පක්ෂ හා හිතවත්කමයි

7. අභියෝග හමුවේ බියෙන් පලා ගොස් කටයුතු කරන්නාගේ මෙලොව, පරලොව ජීවිතය,
   1. අසාර්ථක වේ
   2. සාර්ථක වේ
   3. මධ්‍යස්ථ වේ
   4. සම්පූර්ණ වේ

8. සසර සැරිසරණ සත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන කායික හා මානසික රෝගාබාධ වැලඳීමේ දුක යනු,
   1. ජාති දුකයි
   2. ජරා දුකයි
   3. ව්‍යාධි දුකයි
   4. මරණ දුකයි



EXAMRESULTS.LK

9. බුදු රජාණන් වහන්සේ කලන්දක නිවාප නම් ස්ථානයට වැඩමකොට සුවදුක් විමසා සුවපත් කළේ,

1. සැරියුත් මහරහතන් වහන්සේය
2. මුගලන් මහරහතන් වහන්සේය
3. මහා කාශ්‍යප මහරහතන් වහන්සේය
4. පූතිගත්ත තිස්ස මහරහතන් වහන්සේය

10. බුදු දහම අනුව බව කතරේ අතරමංව සිටින සියලු දෙනාම,

1. අසරණයෝය 2. පව්කාරයෝය 3. බෞද්ධයෝය 4. උන්මත්තකයෝය

11. අප මහා තිලෝගුරු බුදුරජාණන් වහන්සේට මනුෂ්‍ය, තිරිසන්, යක්ෂ, දේව, බ්‍රහ්ම ආදී සියලු සත්ත්ව සමූහයා අතරින් නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ මහා බලයක් තිබුණි. එම බලය,

1. තාදී ගුණය නම් වේ
2. කරුණා ගුණය නම් වේ
3. අසරණ සරණ ගුණය නම් වේ
4. පුරිසදම්ම සාරථී ගුණය නම් වේ

12. යම් පුද්ගලයෙක් නිවන් අවබෝධ කර ගැනීම සඳහා,

1. මෛත්‍රී භාවනාව වැඩිය යුතුය
2. චතුරාර්ය සත්‍ය අවබෝධ කළ යුතුය
3. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා කළ යුතුය
4. සිල් සමාදන් විය යුතුය

13. කය හා වචනය දෙකෙහි සංවර කම,

1. ප්‍රඥාව නම් වේ 2. සමාධිය නම් වේ 3. සීලය නම් වේ 4. අගතිය නම් වේ

14. උතුම් බලාපොරොත්තුවක් ඉටුවන තුරු නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම,

1. දානයයි 2. සීලයයි 3. ඉවසීමයි 4. වීර්යයයි

15. බුදු දහම අනුව දිවා රෑ දෙකෙහි ම භාවනාවට යොමුකළ සිත් ඇති බුදු සව්වෝ නිරතුරුවම,

1. ජීවත් වෙති
2. සතුටු වෙති
3. ප්‍රබුද්ධ ජීවිතයක් ගත කරති
4. අලස කමින් කල් ගෙවති

16. පුද්ගල සිතෙහි පවතින නොසන්සුන් බව, විසුරුණු ගතිය, සෙලවෙන ගතිය,

1. උද්ධච්ච නම් වේ 2. කුක්කුච්ච නම් වේ 3. ව්‍යාපාද නම් වේ 4. විචිකිච්ඡා නම් වේ

17. රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි ලියූ බෞද්ධයාගේ අත්පොත ග්‍රන්ථය මගින් පෙන්වා දෙන්නේ,

1. සිල් සමාදන් වන උපාසක උපාසිකාවන් උපෝසථ සීලය ගත කළ යුතු ආකාරය යි
2. සමාජයේ බොහෝ දෙනා අතර පවතින ප්‍රශ්න සියල්ලටම පිළිතුරු දීම පිළිබඳව යි
3. බෞද්ධ ජීවිතයක් හොඳින් ගත කරන ආකාරය පිළිබඳව යි
4. අභිධර්මය ඉගෙනීමට කැමති අයට ඉහළ දැනුමක් ලබා දීම පිළිබඳව යි

18. සමාජයේ ජීවත්වන සියල්ලන්ටම ඖෂධ හා උත්තේජක ද්‍රව්‍ය මෙන් ම ද්‍රාවණ ආදිය මගින් මනස විකෘති කරගන්නවුන්ගේ හිරිහැර වලින් මිදී ජීවත්වීමට අයිතිය ඇත. එම අයිතියට හානි කරන අය ආරක්ෂා නොකරන සිල් පදය වන්නේ,

1. පළමු සිල් පදය 2. තුන්වන සිල් පදය 3. හතරවන සිල් පදය 4. පස්වන සිල්පදය

19. බුදු දහමෙහි හොඳින් කාබී ජීවත්වීම පමණක් මිනිසාගේ දියුණුව යැයි සිතන්නෝ උපමාකොට ඇත්තේ,

1. උලාකැමෙහි සමත් ගවයන්ට ය
2. ගසා කැමෙහි සමත් අධාර්මික වෙළඳුන්ට ය
3. කිලිටි දිවි පැවතුම් ඇති සූර කපුටන්ට ය
4. කෙළෙස් මුලිනුපුටා දැමූ වීර පුරුෂයන්ට ය

20. බුදු දහම අනුව ධාර්මික රැකියාවක් ලෙස නොසලකන්නේ,

1. වෙළෙඳාම 2. රාජ්‍ය සේවය 3. ගව වෙළෙඳාම 4. කෘෂි කර්මාන්තය

21. අනුවණයින් ඇසුරු නොකිරීම, නුවණැත්තන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම යන කරුණු ඇතුළත් වන්නේ,

1. කරණීය මෙත්ත සූත්‍රයේ ය
2. පරාභව සූත්‍රයේ ය
3. රතන සූත්‍රයේ ය
4. මහා මංගල සූත්‍රයේ ය

22. කේසපුත්ත නියම්ගම් වාසී කාලාමයන්ට බුදු රදුන් දෙසූ යමක් නොපිළිගැනීමට සලකා බැලිය යුතු කරුණු වලට අයත් නොවන්නේ,

1. ආරංචිමාත්‍රයෙන් යමක් නොපිළිගත යුතු ය
2. පරම්පරාවෙන් එන පමණින් යමක් නොපිළිගත යුතු ය
3. තර්කානුකූලව සිතා යමක් පිළිගත යුතු ය
4. සුදුසු බව පෙනෙන නිසා යමක් නොපිළිගත යුතු ය

23. බුදු දහම අනුව යම් පුද්ගලයෙක් සියලු ආගම් අදහන්නේ නම් එය,

1. උමතු ස්වභාවයකි
2. ආගමික සහජීවනයයි
3. සාවද්‍ය කරුණකි
4. සමානාත්මතා මූලධර්මයකි

24. බුදු දහම අනුව පුද්ගල විසමත්වයට හේතු වන්නේ,

1. දේව කැමැත්ත ය
2. අදෘශ්‍යමාන බලවේග වල ක්‍රියාකාරීත්වයයි
3. තමන් තුළ පවතින කර්ම විපාකවල බලපෑමයි
4. දෙමාපිය බලපෑමයි

25. බෞද්ධ නොවන සියලු ආගමික සිද්ධාන්ත විග්‍රහ කොට පසෙකින් තැබීමට උපකාරවන බෞද්ධ ඉගැන්වීම වන්නේ,

1. චතුරාර්ය සත්‍යයයි
2. පටිච්ච සමුප්පාදයයි
3. ත්‍රිලක්ෂණයයි
4. පුනර්භවයයි

26. බෞද්ධ හේතුඵල දහම අනුව තණ්හාව නිසා ඇතිවන්නේ,

1. අවිජ්ජාවයි
2. සංඛාරයි
3. නාම රූපයයි
4. උපාදානයයි

27. අපගේ ඉඳුරන්ටගොදුරුවන දේවල්,

1. පාරභෞතික ධර්ම නම් වේ
2. භෞතික ධර්ම නම් වේ
3. අතීන්ද්‍රිය ධර්ම නම් වේ
4. සේඛියා ධර්ම නම් වේ

28. මිනිසා විසින් පරිසරයට මුදා හරින්නේ,

1. ඔක්සිජන් වායුවයි
2. කාබන් ඩයොක්සයිඩ් වායුවයි
3. නයිට්‍රජන් වායුවයි
4. මීතේන් වායුවයි

29. බුදු දහම උගන්වන අවම ශීල ශික්ෂණය වන්නේ,

1. පන්සිල් ය
2. අටසිල් ය
3. ආජීව අෂ්ටමක සිල් ය
4. උපෝසථ සිල් ය

30. බුදුරජාණන් වහන්සේ චුල්ලවග්ග පාලියෙහි වත්තක්ඛන්ධකයේ දීර්ඝ ලෙස විස්තර කර ඇත්තේ,

1. භික්ෂූන් වහන්සේලා සෙනසුන් පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳව ය
2. භික්ෂූන් වහන්සේලා කුණු රොඩු දැමීම පිළිබඳව ය
3. භික්ෂූන් වහන්සේලා ඉඳුල් හප ඇට ආදිය දැමීම පිළිබඳව ය
4. භික්ෂූන් වහන්සේලා සිවුරු ඇඳීම පෙරවීම පිළිබඳව ය

31. "සමජීවිකතා" යන්නෙහි අදහස වන්නේ,

1. සමගියෙන් කථාබහ කිරීමය
2. ආදායමට වඩා වියදම් කිරීමය
3. අය-වැය දෙක සමානව තුලනය කරගෙන ජීවත් වීමය
4. ආදායම අඩුකර ගැනීමයි

32. හේතුඵල සම්බන්ධය මත විශ්වයේ පරිනාමය සිදුවන බව ඉගැන්වෙන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,

1. වසල සූත්‍රය.
2. අග්ගඤ්ඤ සූත්‍රය.
3. රතන සූත්‍රය.
4. පරාභව සූත්‍රය.

33. බුදුවරයෙකු ලොව පහළ වන්නේ,
   1. ඉපදීමට වෙනත් ලොවක් නැති නිසාය.
   2. ලොව තුළ ගැටලු ඇතිකිරීම සඳහාය.
   3. මිනිස් වර්ගයා මුහුණ දෙන සසර දුක හෙළිදරව් කිරීමටය.
   4. විවිධ ආගමික පිරිස් සමග විවාදාපන්න වීම සඳහාය.

34. අරහත් ඵලය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා පිරිය යුත්තේ,
   1. පාරමී ධර්ම පමණි.
   2. උප පාරමී ධර්ම පමණි.
   3. පරමත්ථ පාරමී පමණි.
   4. පාරමී හා උපපාරමී පමණි.

35. කුසල් යන්න හා නොගැළපෙන්නේ,
   1. නිරෝගී.
   2. නිවැරදි.
   3. විශේෂඥ.
   4. දක්ෂ.

36. සීලයෙන් තොර සමාධියක්ද සමාධියෙන් තොර ප්‍රඥාවක් ද නැත්තා සේ ප්‍රඥාවෙන් තොරව නැත්තේ,
   1. සසරයි.
   2. විසුද්ඤාණයයි.
   3. ආත්මයයි.
   4. විමුක්තියයි.

37. ධම්ම පදයට අයත් නොවන්නේ,
   1. යමක වග්ග.
   2. ප්‍රමාද වග්ග.
   3. අත්ත වග්ග.
   4. බාල වග්ග.

38. චූල්ලකම්ම විභංග සූත්‍රයේ එන පුද්ගල විසමතාවක් වූ " දුබ්බණ්ණා " යනු.
   1. අඩු ආයුෂ ඇති බවයි.
   2. දීර්ඝායුෂ ඇති බවයි.
   3. බොහෝ ආබාධ ඇති බවයි.
   4. අවලස්සන බවයි.

39. චක්කවත්ති සිහනාද සූත්‍රය අනුව දිළිඳුකම නැතිවිට,
   1. සොරකම නැති වේ.
   2. අවි ආයුධ නැති වේ.
   3. ප්‍රාණඝාතය නැති වේ.
   4. බොරුව නැති වේ.

40. මිනිස් සිරුර වෙන් වෙන් වශයෙන් ගත් කළ වෙනසක් නැති බවටත් ලිංග ජාති වශයෙන් සමානත්වයක් ඇති බවත් සඳහන් වන්නේ.
   1. සිගාලෝවාද සූත්‍රයේ ය.
   2. වාසෙට්ඨ සූත්‍රයේ ය.
   3. අම්බට්ඨ සූත්‍රයේ ය.
   4. පරාභව සූත්‍රයේ ය.

(ලකුණු 1 X 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :-- ...........................................................................

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. i. බුදු සිරිතේ එන අසරණ සරණ ගුණයට උදාහරණ දෙකක් ලියන්න.
   ii. ප්‍රඥාව දියුණු කරගන්නා ක්‍රම 3 කි. ඉන් දෙකක් නම් කරන්න.
   iii. දූරංගමං ඒකචරං.... ගාථාව සම්පූර්ණ කරන්න.
   iv. වාචසික සීලයේ අංග දෙකක් නම් කරන්න.
   v. පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ කරුණු 2 ක් ලියන්න.
   vi. සතර සංග්‍රහ වස්තු නම් කරන්න.
   vii. චේතනාහං භික්ඛවේ... පාඨයේ සරල අර්ථය ලියන්න.
   viii. බුදු දහමේ මූලික ඉගැන්වීම් දෙකක් ලියන්න.
   ix. අනුග්‍රහ බුද්ධියෙන් දෙන දානය යන්න හඳුන්වන්න.
   x. බුදු රජාණන් වහන්සේට අපහාස කළ දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2 X 10 = 20)

2. i. බුදු දහම අනුව පුද්ගලයාට වැළදෙන සියලුම රෝගාබාධ කොටස් දෙකකට බෙදේ. එම කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)
   ii. බුදු රජාණන් වහන්සේගේ ගිලානෝපස්ථාන ගුණයට උදාහරණයක් සැකෙවින් ලියන්න. (ලකුණු 03)
   iii. විවිධ හේතු නිසා පුද්ගලයන් රෝගී විය හැකිය. බුද්ධ දේශනාව පරිදි ගිලානෝපස්ථානයේ අගය විස්තර කරන්න (ලකුණු 05)

3. i. සුකරානි අසාධූනි... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
   ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)
   iii. ධම්ම පද ගාථාවලින් පෙන්වා දෙන උපදේශ සිසුන් වශයෙන් ප්‍රායෝගික ජීවිතයට යොදා ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

4. i. බුදු රජාණන් වහන්සේ ''කක්කරපත්ත'' නමැති කෝලිය ගමේ ''දීඝ ජාණු'' කෝලිය පුත්‍රයාට මෙලොව හිතසුව පිණිස දේශනා කළ කරුණු හතර ලියන්න. (ලකුණු 02)
   ii. ඉහත i. හි සඳහන් කළ කරුණක් මෙලොව දියුණුවට හේතුවන ආකාරය සැකෙවින් හඳුන්වන්න. (ලකුණු 03)
   iii. පුද්ගල දියුණුව හෝ පිරිහීම උදාකරගන්නේ තමාමය. සූත්‍ර ධර්ම ඇසුරින් මෙම කාරණය විස්තර කරන්න. (ලකුණු 05)

5. i. සහජීවනය යන්න සැකෙවින් හඳුන්වන්න. (ලකුණු 02)

ii. විවිධ ආගම් අදහන පිරිසක් සිටින ශ්‍රී ලංකාවේ සහජීවනය සඳහා මග පාදන බෞද්ධ ප්‍රතිපත්ති 3 ක් නම් කරන්න. (ලකුණු 03)

iii. ඉහත ii. හි සඳහන් කළ බෞද්ධ ප්‍රතිපත්ති මගින් ජාතික ආගමික සමගිය තහවුරු වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

6. i. බුදු රජාණන් වහන්සේ චූල්ල කම්ම විභංග සූත්‍රය දේශනා කළේ කවරෙක් සඳහාද? (ලකුණු 02)

ii. ඉහත සූත්‍රය අනුව පහත දැක්වෙන පුද්ගල විසමතා සඳහා බලපාන හේතු නම්කරන්න.
දීර්ඝායුෂ විඳීම, පොහොසත්වීම, ප්‍රඥාව අඩුව ඉපදීම (ලකුණු 03)

iii. කර්මය හා විපාකය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 05)

7. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. තාදී ගුණය
ii. හේතුඵල දහම
iii. විදර්ශනා භාවනාව
iv. සීල පාරමිතාව (ලකුණු 5 X 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය

### පිළිතුරු පත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. - 2 | 2. - 2 | 3. - 2 | 4. - 2 | 5. - 1 | 6. - 3 | 7. - 1 |
| 8. - 3 | 9. - 2 | 10. - 1 | 11. - 4 | 12. - 2 | 13. - 3 | 14. - 4 |
| 15. - 3 | 16. - 1 | 17. - 3 | 18. - 4 | 19. - 3 | 20. - 3 | 21. - 4 |
| 22. - 3 | 23. - 1 | 24. - 3 | 25. - 2 | 26. - 4 | 27. - 2 | 28. - 2 |
| 29. - 1 | 30. - 1 | 31. - 3 | 32. - 2 | 33. - 3 | 34. - 1 | 35. - 3 |
| 36. - 4 | 37. - 2 | 38. - 4 | 39. - 1 | 40. - 2 | | |

## II කොටස

1. i. සුනීත, සෝපාක, රජ්ජුමාලා, ආලවක කුමරු, දීඝායු කුමරු, ඡත්ත මානවක, මට්ටකුණ්ඩලී, පේෂකාර දියණිය, වරදට හසු වූ අසරණ ගොවියා, භද්‍රවතිකා ඇතින්න, ගැරඩියාට හිංසා කළ ළමුන්ගෙන් ගැරඩියා නිදහස් කිරීම... යනාදී උදාහරණ වලින් දෙකක්.
   ii. සිතීම (චින්තාමය ප්‍රඥා), භාවනා කිරීම (භාවනාමය ප්‍රඥා), කියවීම (සුතමය ප්‍රඥා)
   iii. දූරං ගමං ඒකචරං - අසරීරං ගුහා සයං
   යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාර බන්ධනා
   iv. සත්‍ය කථා කිරීම, සමගියට හේතුවන වචන කථා කිරීම, මිහිරි වචන කථා කිරීම, දැහැමි වචන කථා කිරීම හෝ මෙම අරුත දෙන වෙනත් අදහස්.
   v. සද්ධර්මයට අකැමැතිවීම, අසත්පුරුෂයන් ප්‍රිය කිරීම, නිතරම නිදන සුළු බව, අලසකම ආදී කරුණු වලින් දෙකක්. (පෙළ පොත පිටු අංක 66, 67)
   vi. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව
   vii. මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයෙන් වචනයෙන් මනසින් කර්ම සිදු කරයි.
   viii. පුනර්භවය, කර්මය, හේතුඵල දහම, චතුරාර්ය සත්‍යය
   ix. කෙනෙකුගේ අසරණකම ගැන සිතා ඔහුට උපකාරයක් වශයෙන් කරුණාවෙන් අනුකම්පාවෙන් යමක් පරිත්‍යාග කිරීම.
   x. මාගන්ධිය, චිංචිමානවිකාව, අක්කෝසක භාරද්වාජ, කසී භාරද්වාජ වැනි අයගෙන් දෙදෙනෙක්.

2. i. කායික රෝග හා මානසික රෝග (චෛතසික රෝග)
   ii. පූතිගත්ත තිස්ස තෙරුන් සුවපත් කළ ආකාරය, උදරාබාධයකින් පෙළුණු භික්ෂුවකට පිහිටවීම, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සුවපත් කිරීම, මුගලන් මහරහතන් වහන්සේ සුවපත් කිරීම ආදී එක් අවස්ථාවක බුදු රදුන් ක්‍රියා කළ ආකාරය විස්තර විය යුතුය.
   iii. බුදු රජාණන් වහන්සේ සියතින්ම රෝගී වූ පුද්ගලයන් සුවපත් කළ බව.
   භික්ෂූන් වහන්සේලා කැඳවා ගිලානෝපස්ථානය බුද්ධ පූජාවක් බවට පත්කිරීම. ගිලනුන්ට උපස්ථාන කරන්නා මට උපස්ථාන කරන්නේය යනුවෙන් දේශනා කිරීම.
   ගිලානෝපස්ථාන කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග 5 ක් පෙන්වාදීම.
   කුමනාකාර රෝගියෙකු වුවද නිරෝගී අයගේ සහාය ලැබිය යුතු බව.
   රෝගී වූ විට සුවදුක් බැලීමට යාම, නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීම.

3. i. සුකරානි අසාධූනී - අත්තනෝ අහිතානිච     යංවේ හිතං ච සාධුං ච - තං වේ පරම දුක්කරං
   ii. තමාට අහිත වූ යහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය.
   iii. ධම්ම පද ගාථා අවම වශයෙන් තුනක් වත් ඇසුරින් පිළිතුර ගොඩනැගිය යුතුය. ඒ ඇසුරින් ලබා දී ඇති උපදේශ සඳහන් කළ යුතු ය.

   එම උපදෙස් ශිෂ්‍යයන් වශයෙන් ප්‍රායෝගිකව ජීවිතයට සම්බන්ධ කරගන්නා ආකාරය විස්තර කළ යුතුය.

4. i. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා
   ii. උට්ඨාන පටිපදා - තමන් කරන කවරම හෝ රැකියාවක් උත්සාහයෙන් .... මහන්සියෙන් දහදිය හෙළා ධාර්මික ක්‍රියා අනුගමනයෙන් ක්‍රියාකාරකම කිරීමයි. එසේ කළ යුතු ධාර්මික රැකියා 6 ක් ද දක්වා ඇත.
   ආරක්ඛ සම්පදා - ධාර්මිකව උපයාගත් ලෞකික ධනය විනාශ වීමට ඇති ක්‍රම 4 ක් ඇත. රජයට අයත්වීම,

සොරුන් විසින් පැහැර ගැනීම, ගින්නෙන් හෝ ජලයෙන් විනාශයට පත්වීම හා තමා අප්‍රිය අයට අයත්වීම යන ක්‍රම වලින් ධනය විනාශ වීමට ඉඩනොදී එය මැනවින් ආරක්ෂා කිරීම ආරක්ඛ සම්පදා නම් වේ.

කල්‍යාණ මිත්තතා- යහපත් මිත්‍රයන් ඇසුරු කිරීම මින් අදහස් වේ. එවැනි මිත්‍රයන් තුළ ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්ම හතර තිබෙන බැවින් ඇසුරු කරන අය තුළ ද මෙම ලක්ෂණ දක්නට ලැබේ.

සමජීවිකතා - අය - වැය දෙක මනාව තුලනය කරගෙන ධනය පරිහරණය කිරීම මින් අදහස් කෙරේ.

iii. බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කළ සූත්‍ර ධර්ම රාශියකින්ම පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන කරුණු දක්වා ඇත.

ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, පරාභව සූත්‍රය, මහා මංගල සූත්‍රය යන සූත්‍ර අනුව බුදු රජාණන් වහන්සේ මෙලොව දියුණුවට හේතු දේශනා කර ඇත.

මෙම සූත්‍ර දේශනා අනුව පුද්ගලයා තමාගේ දියුණුව හෝ පිරිහීම උදාකරගන්නා ආකාරය විස්තරාත්මකව දක්වා ඇති පිළිතුරු සඳහා උපරිම ලකුණු දෙන්න.

5. i. සහජීවනය නම් ... සාමයෙන්, සමගියෙන්, සහයෝගයෙන් ජීවත් වීමයි. එකමුතුව කටයුතු කිරීමයි. මෙය මිනිස් සමාජයක තිබිය යුතු උසස් ලක්ෂණයක් ලෙස බුදු දහම සලකයි.

ii. පංච ශීලය, සතර සංග්‍රහ වස්තු, සතර බ්‍රහ්ම විහරණ

iii. පංච ශීලය ගත්විට එය එක් ජාතියකට පමණක් සීමා නොවූවකි. එහි එන සිල් පද වෙන් වෙන්ව ගත් විට සමස්ථ විශ්වයටම යහපත පිණිස පවතී.

සතර සංග්‍රහ වස්තු නම් දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව යන්නය. මෙහි දානය ගත්විට ජාති ආගම් තුළ භේදයකින් තොරව ප්‍රගුණ කළ හැකි ගුණ ධර්මයකි. අනෙකුත් කරුණු ද එසේ සියලුම මනුෂ්‍යයන්ට යහපත පිණිසම හේතු වේ.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ ද පුද්ගලයා උසස් මට්ටමකට පත්කරන උතුම් පැවතුම් හතරකි. මේවාද ඕනෑම ජාතියකට ආගමකඅයෙකුට පිළිපැදිය හැකිය.

මෙසේ ඉහත සඳහන් කරුණු පිළිපදින විට ආගමික හා ජාතික විශ්වාසය ඇති වේ. අහිතකර ආකල්ප මග හැරේ. ඒ ඒ කණ්ඩායම් අතර සුහදතාවය වර්ධනය වේ. අන්තර් ආගමික හා ජාතික සුහදතාව වර්ධනය වේ. (මෙම කරුණු හා ගැලපෙන වෙනත් කරුණු සහිත පිළිතුරු සඳහා උපරිම ලකුණු දෙන්න.)

6. i. තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට

ii. සතුන්ට දයාව දැක්වීම, දන්දීම, කුසල් මොනවාද අකුසල් මොනවාද යන්න නොවිමසීම

iii. බුදු දහමේ කර්මය යනු සචේතනික ක්‍රියාවයි. එනම් සිතා මතා කරන ක්‍රියාවන් ය. ඒවා කුසල් හා අකුසල් යනුවෙන් කොටස් දෙකකට බෙදේ. කුසල කර්ම කළ විට කුසල විපාක ද අකුසල කර්ම කළ විට මරණින් මතු දුගතියේ ද උපත ලබයි. මිනිස්සු සිත, කය, වචනය යන තිදොරින්ම මෙම කර්ම රැස් කරයි. මෙම කාරණය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරන පුද්ගලයා අකුසලයෙන් වැළකී කුසල කර්ම කිරීමට පෙළඹෙයි. චූල්ල කම්ම විභංග සූත්‍රය අනුව ද කරන ක්‍රියාව අනුව ලැබෙන ප්‍රතිඵලය දක්වා ඇත. ඒ අනුව දන්දීම, සිල් රැකීම, භාවනා වැඩීම, සත්ව කරුණාව, මෛත්‍රිය, පරිත්‍යාගය, පිදිය යුත්තන් පිදීම වැනි ගුණාංග වලට පුද්ගලයා යොමු වේ. එහි ප්‍රතිඵල වශයෙන් සමාජ සාධාරණත්වය, සමගිය, සහජීවනය, එකමුතුකම යනාදී ගුණාංග වර්ධනය වී පුද්ගලයාගේ මෙලොව ජීවිතය ද පරලොව ජීවිතය ද සාර්ථක වේ.

7. i. තාදී ගුණය - ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, දුක, සැප යන අටලෝ දහමින් කම්පාවට පත් නොවී මධ්‍යස්ථව කටයුතු කිරීමේ ගුණය තාදී ගුණය නම් වේ. බුදු රජාණන් වහන්සේ ද මෙම අටලෝ දහමට යටත්වූණි. එහි එන ලාභ, යස, ප්‍රශංසා, සැප යන කරුණු හතරට පුද්ගලයා කැමති වන අතර, අලාභ, අයස, නින්දා, දුක යන කරුණු වලට අකමැත්තක් දක්වයි. කෙසේ වෙතත් බුද්ධිමත් පුද්ගලයා මෙම කරුණු වලදී උද්දාමයට හෝ අසහනයට පත් නොවී අකම්පිතව ක්‍රියා කළ යුතුය.

ii. හේතුඵල දහම - බුදු දහමේ පදනම වශයෙන් හේතුඵල දහම හැඳින්වේ. මෙය පටිච්ච සමුප්පාද දහම වශයෙන් ද හඳුන්වයි. බුද්ධ ධර්මය හා පටිච්ච සමුප්පාදය දෙකක් නොව එකක් ම බව බුදු රජාණන් වහන්සේ පෙන්වා දී ඇත. මෙම ධර්මයේ අංග දොළහක් ඇත. එය අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං... යනාදී වශයෙන් අනුලෝමව ද පටිලෝමව ද ඇතිවන ආකාරය පෙන්වා දිය හැකිය. මෙම පටිච්ච සමුප්පාදය මගින් සංසාරගත දුක ඇතිවන හා නැතිවන ආකාරයත් සමාජගත දුක ඇතිවන හා නැති වන ආකාරයත් පෙන්වා දී ඇත. අපට එදිනෙදා ජීවිතයේ මුහුණ දීමට සිදුවන ගැටලු විසඳා ගැනීමේ න්‍යායක් වශයෙන් ද මෙය භාවිතා කළ හැකි ය.

iii. විදර්ශනා භාවනාව - බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේදයක් වන්නේ විදර්ශනා භාවනාවයි. විපස්සනා භාවනාව, ප්‍රඥා භාවනාව, ත්‍රිලක්ෂණ භාවනාව යනුවෙන් ද මෙම භාවනාව හඳුන්වයි. ජීවිතය හා ලෝකය දෙස ත්‍රිලක්ෂණයට අනුව බලමින් මෙම භාවනාව වැඩීම තුළින් ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ කරගත හැකිවෙයි. අවසානයේ ප්‍රඥාව පහළ වී නිර්වාණ මාර්ගය ද සාක්ෂාත්කරගත හැකිය. ශරීරයේ අස්ථිර බව දුක් බව පිළිකුල් බව යනාදිය අවබෝධ වන්නේ මෙම භාවනාව වැඩීම තුළිනි. මානසික අසහනය නැති වී සිතේ ප්‍රබෝදය ඇති කිරීමට මෙම භාවනාව උපකාරී වේ.

iv. සීල පාරමිතාව - කය වචනය දෙකෙහි සංවරය සීලයයි. එනම් කායික හා වාචසික වශයෙන් අයහපත් ක්‍රියා වලින් වැළකී යහපත් ක්‍රියාවල යෙදීමයි. සීලය පාරමිතාවක් වීමට තණ්හාවෙන්, මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් වැළකී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව සීලය ආරක්ෂා කළ යුතුය. සීල පාරමිතාව පියවර තුනකින් යුක්ත වේ. සීල පාරමී, සීල උප පාරමී හා සීල පරමත්ථ පාරමී යනුවෙන් එහි ප්‍රභේද 3 කි. අප මහා බෝසතාණෝ සීල විමංස ජාතකය තුළින් සීල පාරමිතාව පිරූ ආකාරය පැහැදිලි වේ.